සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

පාසල්වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම
සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

# "අදිති"

## පෙරහුරු විභාගය - 06

පැය 01 ය මිනිත්තු 15

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 57 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

01. පහත දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඡේදය ඇසුරින් සපයන්න.

අහසේ වලාකුළු ඒ මේ අත පා වෙයි. හිරු රැස් වැටී වලාකුළක් රිදී පාටින් බබළයි. හිරු බැස යන අහසේ අලංකාරය වැඩි විය. කෑම සොයා ගිය කුරුල්ලෝ ආපසු කැදලි කරා පියඹා යති. ටිකින් ටික අහස පුරා අඳුර පැතිරෙයි. පරිසරය අඳුරු වෙත් ම වවුලෝ කෑම සොයා පියඹා යති. සඳ නැග එයි. සඳ එළියෙන් අහස ආලෝකවත් වෙයි. සඳ වටා ඇති තරු දිලිසෙයි. සිකුරු තරුව රන්වන් පාටට බබළයි. පරිසරය පුරා ම සිසිල් සුළඟක් හමා යයි. ඒ සුළඟේ මල් සුවඳ පැතිරී යයි.

(i) ඡේදයට අනුව අහසේ අලංකාරය වැඩි වුයේ කවර අවස්ථාවේ ද ?

..........................................................................................

(ii) මෙම අවස්ථාවේ කෑම සොයා පියඹා යන්නේ කවුරුන් ද ?

..........................................................................................

(iii) **සෑම තැනක ම** යන අදහස දීමට ඡේදයේ යෙදී ඇති පදය කුමක් ද ?

..........................................................................................

(iv) මෙහි ඇති බහුවචන වර්තමාන කාලයේ ක්‍රියා පදයක් ලියන්න.

..........................................................................................

(v) **අඳුරෙන්** යන්නෙහි විරුද්ධාර්ථ පදය මෙම ඡේදයෙන් තෝරා ලියන්න.

..........................................................................................

(vi) මූර්ධජ අකුරකට පසු සඤ්ඤක අකුරක් සහිත වචනය තෝරා ලියන්න

..........................................................................................

02. පහත සඳහන් වැකි ලිඛිත භාෂාවෙන් ලියන්න.

(i) අපි පාසල් ගියා. ..........................................................................................

(ii) කුරුල්ලෝ කූඩුවලට ආවා. ..........................................................................................

(iii) වලාකුළු අහසේ පා වුණා. ..........................................................................................

03. අක්ෂර වින්‍යාසය නිවැරදි කර පහත වාක්‍ය නැවත ලියන්න.

(i) කෘත්‍රිම ආහාර අනුබවය අත්හැර දේශීය ආහාර පරිබෝජනයට ගනිමු.

……………………………………………………………………………………

(ii) පරිඝණකය තොරතුරු හුවමාරු කර ගන්නා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි.

……………………………………………………………………………………

04. පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.

(i) ................................. විරිත් (ii) කෙළි................................... (1 x 13 = 13)

05. පහත සඳහන් එක් එක් වගන්තිය සඳහා ගැළපෙන පදය වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

( යති / ගියහ /නිවස / පියා / ගනිමි / වේගයෙන් / සරුංගල් )

(i) බහු වචන අතීත කාල ක්‍රියා පදයකි. ................................................

(ii) ප්‍රාණවාචී ඒක වචන නාම පදයකි. ................................................

(iii) අප්‍රාණවාචි බහු වචන නාම පදයකි. ................................................

(iv) උත්තම පුරුෂ ඒක වචන ක්‍රියා පදයකි. ................................................

06. පහත සඳහන් ඉඟි වැකිවලට ගැළපෙන අදහස වරහන් තුළින් තෝරා ලියන්න.

(i) අහසෙ මාලිගා ................................................................................

(ii) ඉහේ මලක් පිපුණා - ................................................................................


( ඉටු නොවන සිහින මැවීම / දැඩි සේ බියට පත් වීම / දැඩි සතුටකට පත් වීම )

07. පහත දැක්වෙන වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.


(i) තරුවක් අහසේ බබළයි. ................................................................................

(ii) ඔහු පාරේ ගමන් කරයි ................................................................................

08. පහත රූප සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන වචන ඉංග්‍රීසි අකුරින් ලියන්න.



| S | | | | |
|---|---|---|---|---|



| B | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|

09. පහත සඳහන් වාක්‍ය ඉංග්‍රීසියෙන් කියවෙන ආකාරය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

මට නටන්න පුළුවන්: ................................................................................

10. පහත සඳහන් වාක්‍යවල සිංහල තේරුම සිංහල අකුරින් ලින්න.

(i) How old are you ? - ................................................................................

(ii) This is my house - ................................................................................

11. පහත වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

(i) in / hand / my / is / What ................................................................

(ii) a / This / tree / is / banana ................................................................

12. පහත වාක්‍යය දෙමළෙන් ලියන ආකාරය සිංහල අකුරින් ලියන්න.

මෙහි එන්න. : ................................................................................

13. පහත වාක්‍යයෙහි සිංහල තේරුම ලියන්න.


එනදු පෙයර් සාගර :- ................................................................................ ( 1 x 17 = 17)

- **අංක 14 සිට 29 තෙක් දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.**

14. 9090 ට පෙර සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.


    ...........................................................................................................

15. පහත ඇති මල් සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ලියන්න. ......................................



......................................

16. රවුම තුළ ඇති ඉලක්කම්වලින් සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව අකුරෙන් ලියන්න.




................................................................................

17. නිසිත පාසලේ පැවති සිඟිති පොළට රඹුටන් ගෙඩි 240ක් රැගෙන එන ලදී. පසුව ගුරුතුමාගේ උපදෙස් අනුව ගෙඩි 6 බැගින් ගොඩවල් ගසා එක ගොඩක් රු. 10.00 බැගින් විකුණන ලදී.

    (i) නිසිත විකුණූ රඹුටන් ගෙඩි ගොඩවල් ගණන කීයද ?......................................

    (ii) රඹුටන් විකිණීමෙන් ඔහු උපයා ගත් මුදල කීයද ? ................................................

18. කමල් කැපූ කාණුවේ දිග නිමල් කැපූ කාණුවේ දිගින් අඩකට වඩා සෙ.මී. 30 ක් වැඩි ය. නිමල් කැපූ කාණුවේ දිග 2m ක් නම් කමල් කැපූ කාණුවේ දිග කීයද ?

    ................ m ............................ cm


19. පෙරවරු 2 .30ට අනුරාධපුරෙන් පිටත් වූ දුම්රිය පෙරවරු 6 .30ට කොළඹ කොටුව දුම්රිය ස්ථානයට ළඟා විය.

    (i) දුම්රිය ගමනට ගත වූ කාලය සොයන්න. පැය ........................................

    (ii) ගමන අවසන් කළ වේලාව පැය විසිහතර ඔරලෝසුවේ දැක්වෙන ආකාරයට ලියන්න.

    ......................................................

20. නගර කීපයක් දැක්වෙන සටහනක් පහත දැක් වේ




කොළඹ සිට දඹුල්ලට දුර 170 km ද

කුරුණෑගල සිට පොළොන්නරුවට දුර 140 km ද

කුරුණෑගල සිට දඹුල්ලට දුර 80 km ද නම්

කොළඹ සිට පොළොන්නරුවට දුර කොපමණ ද?.................................... km

21. සංඛ්‍යා යෙදී ඇති රටාව අනුව හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

    275 , 300 , 325 , 350 ......................................

( 2 x 8 = 16)

22. පහත බිල්පතෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | ඒකක මිල(රුපියල්) | ඒකක ගණන | මුදල |
|---|---|---|---|
| පැන්සල | 28 | 4 | ...................... |
| වතුර බෝතලය | 225 | ............ | 675 |
| | | එකතුව | 787 |

23. මාර්ගයක A සිට B දක්වා දුර 45km කි. A සිට 12km 500m ක් ගමන් කළේ බසයෙනි. ඉතිරිය දුම්රියෙන් ගියේ නම් දුම්රියෙන් ගිය දුර කොපමණ ද ?

................. km .................... m

24. ගමනකින් $\frac{1}{3}$ ක් යාමට ඉන්ධන ලීටර් 8 ක් වැය විය. ඉන්ධන ලීටරයක් රු. 300.00 ක් නම් සම්පූර්ණ ගමන යාමට අවශ්‍ය මුළු ඉන්ධන සඳහා වැය වන මුදල කීය ද?

රුපියල්............................................................

25. තරාදියක් මත තැබූ කොමඩු ගෙඩි දෙකකින් එකක බර 2 kg 850g වේ. අනෙක් ගෙඩියේ බර 2 kg 425g වේ ගෙඩි දෙකේ ම මුළු බර සොයන්න.

............ kg ....................... g


26. බඳුනකට ජලය 5l 950ml පිරවිය හැකි යි. දැනට ජලය 2l 425ml ක ප්‍රමාණයක් පුරවා ඇත්නම් තව දැමිය හැකි ජල ප්‍රමාණය කෙතෙක් ද?

..................... l ....................... ml

27. $\frac{1}{5} + \frac{2}{5} =$ හි අගය සොයන්න. ..........................................................

28. පහත ඝන වස්තුවේ නම කුමක් ද?


..............................................................



29. (i) ප්‍රස්තාරයේ දැක්වෙන තොරතුරු අනුව වගුවෙහි හිස්තැන පුරවන්න.

(ii) වගුවෙහි දැක්වෙන තොරතුරු අනුව ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.


| එළවළු වර්ගය | බර kg |
|---|---|
| බටු | 6 |
| බීට් | 8 |
| මිරිස් | 5 |
| ගෝවා | ....................... |




(2 x 8 =16)

• **අංක 30 සිට 59 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

30. රූපයෙන් දැක්වෙන්නේ සූර්ය නමස්කාර අභ්‍යාසයේ කීවෙනි අවස්ථාව ද?



(1) දෙවන අවස්ථාව
(2) තුන්වන අවස්ථාව
(3) හතරවන අවස්ථාව

31. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමක පියවරවල් කීයක් තිබේ ද?

(1) 3 කි. (2) 2 කි. (3) 5 කි.

32. ශ්‍රී ලංකාවේ සිතියම්වල මහා මාර්ග දැක්වීමට යොදා ඇති සම්මත වර්ණය වන්නේ,

(1) රතු (2) කළු (3) කහ

33. ජාතික කොඩිය ඔසවන විට අප ජාතික ගීය ගායනා කළ යුත්තේ,

(1) කොඩිය ඔසවන විට (2) කොඩිය එසවීමට පෙර (3) කොඩිය එසවීමෙන් පසු

34. ද්‍රවිඩ ජන වර්ගයාගේ අනන්‍යතාව සහතික කරන ආහාරය වන්නේ

(1) බත් (2) පාන් (3) තෝසෙ

35. සිංහල ජන වර්ගයේ කාන්තාවන්ගේ අනන්‍යතාව සහතික කරන ඇඳුම වන්නේ

(1) සාරිය 2. ඔසරිය (3) ගවුම

36. පැළෑටියකට හිරු එළිය නොලැබුණු විට ශාකපත්‍ර ගන්නා පැහැය වන්නේ,

(1) කොළ (2) කහ (3) තැඹිලි

37. ඇස හා කන මගින් එකවර තොරතුරු ලබා දෙන මාධ්‍ය වන්නේ,

(1) රූපවාහිනිය (2) ශබ්දවිකාශන (3) දුරකතනය

38. ශ්‍රී ලංකාවේ පළමුවෙන් ම කර වූ දාගැබ වන්නේ,

(1) රුවන්වැලිසෑය (2) ථූපාරාමය (3) අභයගිරිය

39. ගෙවත්තක බෝග වගාකිරිමේදී භාවිත කරන උපකරණයක් වන්නේ,

(1) උදැල්ල (2) කියත (3) පීර


40. පෘතුගීසීන් විසින් ඉදි කළ ඓතිහාසික බලකොටුවක් පිහිටා ඇති පළාතක් වන්නේ

(1) බස්නාහිර (2) වයඹ (3) දකුණු

41. සිකුරාදා දිනවල තම ආගමික කටයුතු සඳහා දේවස්ථානවලට රැස් වන්නේ

(1) බෞද්ධ භක්තිකයින් (2) කතෝලික භක්තිකයින්
(3) ඉස්ලාම් භක්තිකයින්

42. මෙම උපකරණය යොදා ගන්නේ



(1) පතල් කර්මාන්තයේ දී (2) ධීවර කර්මාන්තයේ දී
(3) වඩු කර්මාන්තයේ දී


43. මැලේරියා රෝගය පැතිරෙන්නේ

(1) ඒඩිස් මදුරුවා මගින් (2) ඇනෝෆිලිස් මදුරුවා මගින්
(3) කියුලෙක්ස් මදුරුවා මගින්

44. අයඩීන් අඩු වීම නිසා වැළඳේ,

(1) ගලගණ්ඩය. (2) සෙංගමාලය. (3) මැලේරියාව.

45. පහත දැක්වෙන සත්ත්ව අනුකරණ ඉරියව්ව කුමක් ද?



(1) කුකුළු ගමන (2) වඳුරු ගමන

(3) ඇත් ගමන

46. මාළුවා ආස්වාස, ප්‍රාස්වාස කරනු ලබන්නේ


(1) පෙනහලු මගින් (2) කරමල මගින්

(3) වරල් මගින්

47. මේ අතුරින් පෞද්ගලික භාණ්ඩයක් වන්නේ


(1) රූපවාහිනිය (2) ගුවන් විදුලිය (3) පනාව

48. නිවැරදි ක්‍රමයට ඇවිදීමේ දී පා සටහන් පිහිටිය යුත්තේ



(1) (2) (3)

49. රූපයේ දැක්වෙන්නේ විදුලි පන්දමක් පෘථිවි ගෝලයට අල්ලා කළ ක්‍රියාකාරකමකි. මින් හඳුනා ගැනීමට උත්සාහ කරන්නේ





(1) පෘථිවිය විදුලි පන්දමකින් ආලෝකමත් කිරිම

(2) ශ්‍රී ලංකාවේ තිබෙන තැන හඳුනා ගැනීම.

(3) දිවා රාත්‍රී ඇති වීම සිදුවන ආකාරය

50. ප්ලාස්ටික් පිඟානක් ගෙන ලුණු දියකළ ජලය දමා ඇති ආකාරය රූපයෙන් දැක්වේ. මෙම ක්‍රියාකාරකමෙන් ඔබ උගත් දේ වනුයේ




(1) ලුණු හොඳින් දියවන බව

(2) මුහුදු ජලයෙන් ලුණු වෙන්කර ගන්නා ආකාරය

(3) මුහුදක් නිර්මාණය කිරීමට හැකිබව

51. පහත රූපයේ දැක්වෙන දේ නිරීක්ෂණය කර නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.



(1) කප්පිය භාවිතා කරන නිවැරදි ආකාරය හඳුනා ගැනීම

(2) ලණුව මගින් බරක් එසවීම

(3) කප්පියක් ආධාරයෙන් බරක් පහසුවෙන් ඉහළට ගතහැකි බව

52. කාබනික පොහොර භාවිතයේ වාසියක් **නොවන්නේ**

(1) විෂ රහිත ආහාර ගැනීමට හැකිවිම (2) නිරෝගී ජීවිතයක් ගතකළ හැකිවීම.

(3) පරිසරය දූෂණය වීම


53. ප්‍රෝටීන් අඩංගු ආහාරයක් **නොවන්නේ**,

(1) මස්. (2) බිත්තර. (3) දෙල්.

54. පහත ඒවායින් ජලය රත් කර ගැනීම සඳහා යොදාගත හැක්කේ,

(1) ගිල්ලුම් තාපකය (2) ස්ත්‍රික්කය (3) හැඹිලිය

55. නිල්පාට තීන්ත බින්දු කීපයක් දමාගත් ජලය විනිවිද පෙනෙන වීදුරුවකට දමා ඇති ආකාරය රූපයේ දැක්වේ. එයට අයිස්කැටයක් දමා ටික වේලාවකට පසු නිරීක්ෂණය කළවිට වීදුරුවේ පිටපැත්තේ දක්නට ලැබුණුදේ සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය කුමක් ද?



(1) කුඩා කුඩා ජල බිංදු වීදුරු බිත්තිය පිට පැත්තේ තැන්පත් වී තිබුණි


(2) වායුගෝලයේ තිබූ ජල වාෂ්ප සිසිල් වී වීදුරු බිත්තියේ තැන්පත් වීම

(3) වීදුරුවේ පිටපැත්තේ ඇති ජල බිංදු නිල්පාට ඒවා වේ.

56. දැති රෝදය භාවිත වන උපකරණයක් වන්නේ

(1) විල්බැරෝව (2) ගොන් කරත්තය (3) ඔරලෝසුව


57. මෙහි සූත්‍රිකාව නම් කර ඇත්තේ





(1) C අක්ෂරයෙනි (2) A අක්ෂරයෙනි

(3) B අක්ෂරයෙනි

58. දණ්ඩ චුම්බකයකට ඇල්පෙනෙති ආකර්ෂණය වන නිවැරදි ආකාරය තෝරන්න.



(1)




(2)




(3)


59. පහත රූප අතරින් බල්බ දෙක දැල්වෙන අවස්ථාව වන්නේ



(1)



(2)



(3)

(1 x 30 = 30)

60. **ගෙවතු වගාව මිනිස් ජීවිතයට අත්වැලකි** යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. ( සෑම වාක්‍යයකුම වචන පහකට වඩා වැඩි විය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධතාවය සහ අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය)

1. ....................................................................................................

....................................................................................................

2. ....................................................................................................

....................................................................................................

3. ....................................................................................................

....................................................................................................

( පිරිසිදුබාවයට ලකුණු දෙකක් ලබා දෙන්න )